නිවුන්නු හත්දෙනා

සහ

තවත් කතා



රුසියන් භාෂාවෙන් පරිවර්තනය

එච්. ජයරත්න

නිවුන්නු හත්දෙනා
සහ
තවත් කතා

රුසියන් භාෂාවෙන් පරිවර්තනය

එච්. ජයරත්න

නිවුන්නු හත්දෙනා සහ තවත් කතා

© රුසියන් බසින් සිංහලයට පරිවර්තනය	එච්. ජයරත්න
පළමු මුද්‍රණය දෙවන මුද්‍රණය	2014 2024
ISBN	978-955-0983-63-6
චිත්‍ර	විතාලි ස්වාරෆ් සහ එලේනා අල්මාසවා
පරිගණක පිටු සැකැස්ම හා අකුරුකරණය	විදුර ප්‍රකාශන, අංක 58, පළමු මහල, සුපිරි වෙළඳ සංකීර්ණය, බොරැල්ල, කොළඹ 08. ☎ 0112 667910
මුද්‍රණය	එස් ඇන්ඩ් එස් මුද්‍රණ ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10. ☎ 0112 431738
ප්‍රකාශනය	සමීර ප්‍රකාශන 12, පොල්දූව, බත්තරමුල්ල. ☎ 011 2868249

නිවුන්නු හත්දෙනා

එකෝමත් එක ගමක නිවුන්නු හත් දෙනෙක් ඉපදුණා. හැමෝටම සිමියෝනෆ් කියල නම තිබ්බා. ඒ ගොල්ල ලොකු මහත් වුණා. හත් දෙනාම එක වගේ. හැමදාම උදේට හත් දෙනාම ගියා කුඹුරෙ වැඩට.

දවසක් රටේ රජ්ජුරුවො ඒ පැත්තෙන් යන්න ආවා. එක වගේම හත් දෙනෙක් කුඹුර හානවා රජ්ජුරුවො දැක්කා. රජ්ජුරුවන්ට පුදුමයි. තමන් ළඟ සේවය කරන්න එන්නැයි කියල රජ්ජුරුවො ඔවුන්ට පණිවිඩයක් යැව්වා.

ඉතින් ඒ නියෝගය අනුව හත් දෙනාම මාලිගාවට ආවා.

''හොඳයි, දැන් මේ එක් එක්කෙනාට මොන මොනවද කරන්න පුළුවන්?'' රජ්ජුරුවො ඇහුවා.

''මට පුළුවන් උසම උස යකඩ කණුවක් හදන්න.'' වැඩිමලා කීවා.

''මට පුළුවන් ඒක පොළොවෙ හිටවන්න.'' දෙවැන්නා කීවා.

''මට ඒක මුදුනට නැගලා ලෝකෙ සිද්ද වෙන දේවල් හැම දෙයක්ම බලා ගන්න පුළුවන්.'' තුන්වැන්නා කීවා.

හතරවැන්නා කීවා ''දිය ගොඩ දෙකේම ගමන් කරන්න නැවක් හදන්න මට පුළුවන්'' කියලා.

''මට පිටරටවලට ගිහින් ඕනෑම බඩුවක් විකුණාන්න පුළුවන්.'' පස් වැන්නා කීවා.

''මට ඒ නැව මිනිස්සුයි බඩුයි එක්කම මුහුදු යටින් අරන් ගිහින් කැමති තැනකින් මතුවෙන්න පුළුවන්.'' කියල හය වැන්නා කීවා.

''මං හොරෙක්.'' හත්වැන්නා කීවා. ''මට ඕනෑම දෙයක් හොරකම් කරන්න පුළුවන්.''

''ඒ වගේ වැඩවලට මගේ රටේ ඉඩ නෑ.'' රජ්ජුරුවො කෝපයෙන් කීවා. ''දවස් තුනක් කල් දෙනවා. මේ රට අත හැරලා කැමති දිහාවකට යන්න පුළුවන්. අනෙක් සිමියෝනෆ් හය දෙනාට මාලිගාවෙ නවතින්න අණ කරනවා.''

හත්වැනි සිමියෝනෆ් දුකට පත් වුණා. ඔය අතරෙ කඳුවලල්ලට එහායින්, මුහුදටත් එහායින් ඇති රටේ රාජ කුමාරි විවාහ කරගන්න රජ්ජුරුවන්ට ඕනෑ වුණා. කොච්චර උත්සාහ කළත් රජ්ජුරුවන්ට ඒ කුමාරි ගෙන්නා ගන්න බැරි වුණා. ඇමතිවරු රජ්ජුරුවන්ට කීවා සමහරවිට අර හොරාට ඒ කුමාරි රවටගෙන එන්න පුළුවන් වෙයි කියල. ඒ හින්ද දැනට එයාට ඉන්න දෙන්න කීවා. රජ්ජුරුවොා කල්පනා කරල බලලා හොරාට නවතින්න අණ කළා.

ඊ ළඟ දවසෙ රජ්ජුරුවොා ඇමතිවරුයි සියලුම රටවැසියොයි රැස් කරලා සිමියෝනෆ්ලට කීවා තම තමන්ගෙ හපන්කම් පෙන්නන්න කියලා.

වැඩිමල් සිමියෝනෆ් ලොකු යකඩ කණුවක් හැදුවා. දෙවැනි සිමියෝනෆ් ඒ කණුව උස්සල පොළොවේ හිටෙව්වා. තුන්වැනි සිමියෝනෆ් ඒ කණුව මුදුනට නැගලා මේ ලෝකෙ සිද්ධ වෙන්නෙ මොනවද කියල

බැලුවා. එයා දැක්කා නිල්පාට මුහුදු, නැව්, ගම්මාන නගර මිනිස්සු වගේ නොයෙකුත් දේවල්. ඒ වගේම ඈතින් ඈතට පුංචි කාමරයක ලස්සන කුමාරිකාවක් ජනේලය ළඟ වාඩිවෙලා ඉන්නවත් දැක්කා. ඇගේ කම්මුල් රෝස පාටයි.

''පේනව.'' එයා ශබ්ද නගා කීවා.

''ඉක්මනින් බිමට බැහැලා කොහොමහරි ඒ කුමාරිකාව අරන් වරෙන්.'' රජ්ජුරුවො අණ කළා.

සිමියෝනෆ්ල හත් දෙනා නැවක් හදලා ඒකෙ නොයෙකුත් බඩු පුරවා ගෙන ගමනට පිටත් වුණා. ගිහින් ගිහින් අන්තිමේදි නොදන්න දූපතකට ළඟා වුණා. හත්වැනි සිමියෝනෆ් තමන්ගේ සයිබීරියානු බළලත් අරගෙනයි ගියෙ. ඌ බොහෝම දක්ෂයි. ඌට කකුල් දෙකෙන් ඇවිදින්න පුළුවන්. කියන ඕනෑම බඩුවක් තෝරල දෙන්න පුළුවන්. නොයෙක් මැජික් පෙන්වන්නත් පුළුවන්. ඉතිං හත්වැනි සිමියෝනෆ් තමා එන තෙක් අය්යලට නැවේ නවතින්න කියලා බළලත් අරන් පිටත් වුණා. නගරයට ඇවිත් රජමාලිගාවේ මිදුලට වෙලා බළලත් එක්ක නොයෙක් විජ්ජා පෙන්නන්න පටන් ගත්තා.

ඒ වෙලාවෙ රජ්ජුරුවන්ගෙ දූ කුමාරිකාව ජනේලය ළඟ වාඩිවෙලා මේ උපන්තේකට දැකල නැති සතා දිහා බලා හිටියා. ඊට පස්සෙ ඒ සතා මොකාද? ඌ විකුණනවද? කියල දැනගෙන එන්න සේවිකාවක් පිටත් කළා.

''මේකා මේ සයිබීරියානු බළලෙක්.'' සිමියෝනෆ් හොරා උත්තර දුන්නා. ''කීයටවත් විකුණාන්නෙ නෑ. හැබැයි කවුරු හරි ඌට හුඟාක් ආදරය කරනවූ නම් තෑගි කරන්නම්.''

සේවිකාව රාජ කුමාරිකාවට ඒ බව කීවාට පස්සෙ තමා ඌට හුඟාක් ආදරේ බව කුමාරිකාව දන්වා යැව්වා.

සිමියෝනෆ් මාළිගාව ඇතුළට ගිහින් තමාගේ සයිබීරියානු බළලා කුමාරිකාවට තෑගි කළා. ඒ වෙනුවට දවස් තුනක් මාළිගාවේ ගත කරන්නත් රාජ භෝජන වළඳන්නත් අවසර ඉල්ලුවා.

කුමාරිකාව ළඟ ජීවිතේට දැකල නැති අරුම පුදුම සතෙක් ඉන්නවයි කියන ආරංචිය පැතිරිලා ගියා. රජ මාළිගාවෙ හැමෝම දුවගෙන ආවා. සමහරුන්ට හරි ආසයි. කොච්චර බැලුවත් ඇති වෙන්නෙ නෑ. රාජකුමාරි රෑ දවල් දෙකේ ඌ අතගාමින් හුරතල් කරනව. හිතේ හැටියට කන්න බොන්න

කියලා ඈ සිමියෝනෆ්ට නියම කළා. කෑම බීම ගැන කුමාරිකාවට ස්තුති කළ සිමියෝනෆ් තමා නැවෙන් ගෙනා දැකපු නොදැකපු සත්තු බලන්න නැවට යන්න ආරාධනා කළා.

දවසක් හැන්දෑවෙ කුමාරිකාව සේවිකාවොත් එක්ක සිමියෝනෆ්ගෙ දැකපු, නොදැකපු සත්තු බලන්න ගියා.

කෝප නොවී සේවිකාවො වෙරළෙ නවත්තල එන්න කියල සිමියෝනෆ් කුමාරිකාවට කීවා.

කුමාරිකාව සේවිකාවන්ට වෙරළෙ නැවතිල ඉන්න අණ කරලා ජීවිතේට දැකපු නැති අරුම පුදුම සත්තු බලන්න නැවට නැග්ගා. ඈ නැවට නගින කොටම නැව පිටත් වුණා.

සේවිකාවො ඈඩා වැලපිලා රජ්ජුරුවන්ට දුක කීවා. බොහෝම කේන්තියට පත් වෙච්ච රජ්ජුරුවො නැවක් සූදානම් කරලා රාජකුමාරිකාව බේරගෙන එන්න කංඩායමක් පිටත් කළා.

තමා පසුපසින් එළවා ගෙන එන බව දැකපු සිමියෝනෆ්ල හත්දෙනා නැවත් එක්කම වතුර යට කිමිදුණා. දිගු කාලයක් වතුර යටින් නැව පදවලා තමන්ගෙ මව් රටට කිට්ටු වුණාම උඩට ආවා. රජ්ජුරුවන්ගෙ කංඩායම දවල් තුනක් තිස්සේ, රෑ තුනක් තිස්සේ පස්සෙන් එලවල එලවලා කිසිම දෙයක් දැක ගන්න බැරි වුණු තැන ආපසු ගියා.

සිමියෝනෆ්ලා හත් දෙනා රාජ කුමාරිකාවත් එක්ක ආපසු තමන්ගෙ රටට ආවා. වෙරළෙ ඇඟිල්ලක් ගහන්න ඉඩක් නෑ. රජ්ජුරුවොත් ආවා වෙරළට සිමියෝනෆ්ලයි රාජකුමාරිකාවයි පිළිගන්න.

කුමාරිකාව සාදරයෙන් පිළිගත්ත රජ්ජුරුවෝ ඈ කිරිගරුඬ ශාලාවට කැඳවා ගෙන ගිහින් දේවදාර මේසයකට වාඩි කරවලා මී පැණිවලින් හදපු බීමවලින් සංග්‍රහ කළා.

දින කිහිපයකට පස්සෙ රජ්ජුරුවො කුමාරිකාව විවාහ කරගත්තා. එදා මුළු රටම එකම මඟුල් ගෙයක්. සිමියෝනෆ්ල හත්දෙනාට තමන් කැමති විදියට රටේ ඕනෑම තැනක ජීවත් වෙන්නත්, වෙළඳාම් කරන්නත් ඉඩම් මිල දී ගන්නත් අවසර දුන්නා. එදා ඉඳලා සිමියෝනෆ්ලා කිසිම දුකක් කරදරයක් නැතිව කාල බීලා සන්තෝසයෙන් ජීවත් වෙනව. ඔව්. කතාන්දරයත් මෙතනින් අවසානයි.

නොමැරෙන මන්තරකාරයා

එකෝමත් එක රටක, එකෝමත් එක රාජධානියක රජ කෙනෙක් හිටියා. එයාට පුත්තු තුන්දෙනනෙක් හිටියා. ඒ ගොල්ල බොහොම සතුටින් ජීවත් වුණා. ඔය අතරෙ එක අවාසනාවන්ත දෙයක් සිද්ධ වුණා. කොෂේයි කියන අමරණීය මන්තරකාරයා බිසව පැහැරගෙන ගියා. මේ කොෂේයි කෙට්ටුයි. මහලුයි. නපුරුයි. නොමැරී ඉන්න රහස දන්නව.

ලොකු පුතා අම්මා හොයාගෙන ගියා. ගියා ගියාමයි ආගිය අතක් නැති වුණා. මද්දුම පුතා බලාගෙන ඉඳලා ඉඳලා බැරිම තැන තාත්තාගෙන් අවසර අරන් අම්මා හොයන්න ගියා. එයත් ආ ගිය අතක් නැති වුණා.

බාල පුතා ඉවාන්. රජ්ජුරුවො කැමති වුණේ නෑ එයාවත් පිටත් කරන්න.

''අය්යලා ආ ගිය අතක් නෑ. උඹත් ගියොත් දුකටම මං මැරිල යයි.''

''නෑ තාත්තෙ, මං අම්මා බේරගෙන එන්නම්.''

ඉවාන් කුමාරයා අශ්වයෙකු තෝරා ගන්න ගියා. අත තියන තියන අශ්වයා බිම ඇද වැටෙනව. ඒ හින්දා අශ්වයකු තෝරා ගන්න බැරි වුණා. බැරිම තැන පයින් ඇවිදගෙන ගියා. එයා බොහොම කනගාටුවෙන් බිම බලාගෙන තමයි ගමන් කෙරුවෙ. මෙන්න එක පාරටම කෙහෙන් ආවද දන්නෙ නෑ වයසක ආච්චි කෙනෙක් ඉස්සරහට එනව.

''මොකද මේ ඉවාන් කුමාරයා බිම බලාගෙන?''

''බලන්නකො ආච්චියේ, මට ගැළපෙන අශ්වයෙකු හොයාගන්න බෑ නොවැ.''

''එහෙනම් එමුකො මාත් එක්ක.''

ඈ ඉවාන් කුමාරයා කන්දක් ළඟට කැඳවාගෙන ගියා.

''මෙතන පොළොව හාරන්න.'' ඈ කුමාරයාට අණ කළා.

ඉවාන් කුමාරයා පොළොව හාරන්න පටන් ගත්තා. හාරා ගෙන යන කොට ඉබ්බො දොළහක් දාපු දොරක් හමු වුණා.

ඉබ්බා කඩලා දොර ඇරලා පොළොව යටට ගමන් කළා. මෙන්න බොලේ දම්වැල් දොළහකින් බැඳල දාපු යුද අශ්වයෙක්. යුද ඇඳුමකුත් තිබුණා. කුමාරයෙක් තමා වෙතට එනව දැකපු අශ්වයා දම්වැල් කඩා ගත්තා. ඉවාන් කුමාරයා යුද ඇඳුමත් ඇඳගෙන මැහැලියට සල්ලි ගෙවලා අශ්වයා පිටින් පිටත් වුණා.

දිග ගමනක් ගියාද කෙටි ගමනක් ගියාද කියන්න දන්නෙ නෑ. අන්තිමේදී නගින්න බැරි දරුණු ප්‍රපාතාකාර කන්දක් මුලට ආවා. කන්ද ළඟදි ඉවාන් කුමාරයාට සහෝදරයින් හමුවුණා. එතැන ඉඳල තුන්දෙනාම එකට ගමන් කළා. එහෙම යන කොට මේ කුමාරයො මහා දැවැන්ත ගල් පර්වතයක් ළඟට ආවා. ඒ පර්වතේ මෙහෙම ලියලා තිබුණා. ''මේ ගල් පර්වතය කන්ද, උඩට වීසි කරන කෙනෙකුට කන්ද උඩට නගින්න පුළුවන්.'' වැඩිමහලු සහෝදරවරුන්ට ගල හොල්ලන්නවත් බැරි වුණා. ඉවාන් කුමාරයා එක පාරටම පර්වතය උස්සලා කන්ද උඩට වීසි කළා. එතකොටම කන්ද උඩට නගින්න පඩිපෙළක් මතු වුණා. සහෝදරයන්ගෙන් සමු ගත් ඉවාන් කුමාරයා කන්ද නගින්න පටන් ගත්තා.

කන්ද නැගගෙන නැගගෙන යනකොට විශාල මන්දිරයක් හමුවුණා. ඒ මන්දිරයේ රාජ කුමාරිකාවක් හිටියා. ඒත් නොමැරෙන කෝෂෙයි පැහැරගෙන ආව කුමාරිකාවක්. ඉවාන් කුමාරයා මන්දිරයෙ තාප්පෙ වටේ යනව යනව ඇතුළු වෙන්න දොරක් නෑ. සඳළුතලයට ආව කුමාරිකාව කුමාරයාට කතා කළා.

''ඔය තාප්පෙ සිදුරක් ඇති. ඒකට සුළැඟිල්ල තියන්න. එතකොට දොරක් මැවෙයි.''

ඉවාන් කුමාරයා ඒ විදිහට මාලිගාවට ඇතුළු වුණා. කුමාරිකාව එයාට කන්න බොන්න දීලා සංග්‍රහ කරලා ආ ගිය තොරතුරු ඇහුවා. කෝෂෙයි එක්ක සටන් කරලා අම්මා බේර ගන්න ආව බව කුමාරයා කීවා.

''වැඩේ එච්චර ලේසි වෙන්නෙ නෑ ඉවාන්.'' කුමාරිකාව කීවා. ''මොකද කෝෂෙයි අමරණීයයි. කවදාවත් මැරෙන්නෙ නෑ.''

ඊට පස්සෙ කුමාරයා තවත් මන්දිරයකට ගියා. එතන එයාගෙ අම්මා හිටියා. අම්මා පුතා බදාගෙන ඇඬුවා. ඊට පස්සෙ අම්මා පුතා හැංගුවා. එතකොටම කෝෂෙයි ආවා.

''මහ්..... මහ්..... මහ්....'' කෝෂෙයි ඉව කළා. ''රුසියන් ගඳක් දැනෙනව. කවුද ආවෙ? පුතාවත් ආවද?''

''ඔයාට පිස්සුද? රුසියාව පුරා කරක් ගහල ඇවිල්ලා දැන් රුසියන් ගඳයි කියනව.''

ඊට පස්සෙ බොහොම ආදරෙන් බිසව කෝෂෙයිට කතා කළා.

''අනේ ඉතිං කියන්නකෝ කෝෂෙයි ඔයාගෙ පණ තියෙන්නෙ කොහෙද කියලා?''

''මුහුදු මැද දූපතක් තියෙනව. ඒ දූපතේ දේවදාර ගහක් තියෙනව. ඒ ගහමුල පෙට්ටගමක් තියෙනව. ඒ පෙට්ටගම ඇතුළෙ හාවෙක් ඉන්නව. ඒ හාවගෙ බඩේ තාරාවියක් ඉන්නවා. ඒ තාරාවියගෙ බඩේ බිත්තරයක් තියනව. අන්න ඒ බිත්තරයෙ තමයි මගේ පණ තියෙන්නෙ.''

කෝෂෙයි එහෙම කියල ටික වේලාවකින් ඉගිලිලා යන්න ගියා

ඉවාන් කුමාරයා කෝෂෙයිගෙ පණ හොයාගෙන ගියා. ඔහු දවස් ගණනාවක් ඇවිද ගෙන ගියා. කෑමක් නෑ. බීමක් නෑ. හොඳටම බඩගිනියි. වටපිට බැලුවම වෘක පැටවෙක් දැක්කා. ඉවාන් කුමාරයා උෆ මරාගෙන කන්න සූදානම් වුණා. එතකොටම වෘක අම්මා ගුහාවෙන් එළියට ආවා.

''මගේ පුතාට හිරිහැර කරන්න එපා. මං ඔබට උදව් කරන්නම්.'' වෘක අම්මා කීවා.

ඉවාන් කුමාරයා වෘක පැටියාට යන්න හැරලා ඉදිරියට යනකොට කපුටකු දැක්කා. උෆට විදලා මරන්න සූදානම් වෙනකොට උෆ කථා කළා.

''මට හිරිහැර කරන්න එපා. මං ඔබට උදව් කරන්නම්.''

ඉවාන් කපුටාට යන්න ඇරියා. ඉදිරියට ගිය කුමාරයා මුහුදු වෙරළකට ආවා. එතකොටම මාළුවෙක් වෙරළට පැන්නා. කුමාරයා උෆ අල්ල ගෙන කන්න සූදානම් වුණා. කොහෙන් පාත් වුණාද දන්නෙ නෑ මෙන්න මාළුවගෙ අම්මා ආවා.

''මගෙ පොඩි එකාට හිරිහැර කරන්න එපා. මං ඔබට උදව් කරන්නම්.

ඉවාන් උෆවත් නිදහස් කළා.

ගැඹුරු මුහුදු හරහා දූපතට යන්නෙ කොහොමද කියලා කුමාරයා කල්පනා කළා. එතකොටම මාළුවා ඇවිත් පාලමක් වගේ දිය මතුපිට හිටියා. ඉවාන් දූපතට ගිහින් දේවදාර ගහ හොයාගෙන පෙට්ටගම ඇරියා. ඒක ඇතුළෙ හිටිය හාවෙක් එළියට පැනල දුවන්න පටන් ගත්තා. ඉවාන් බය වුණා හාවා බේරිලා යයි කියලා. ඒත් එතකොටම වෘක ඩේනුව හාවා පස්සෙ එලවලා අල්ලාගෙන ආවා. සතුටට පත් ඉවාන් හාවා අතට ගන්නකොට උගේ බඩේ ඉඳලා තාරාවෙක් ඉගිල්ලිලා ගියා. ඉවාන් දුන්නෙන් විද්දා. ඒත් ඊතල ළඟින් ගියා මිසක් තාරාවට වැදුණෙ නෑ. ඒ වෙලාවෙ කපුටා ඇවිත් තාරාව අල්ලා ගෙනත් දුන්නා. ඉවාන් උගේ බඩෙන් බිත්තරය එළියට ගත්තා. ඒත් අවාසනාවක මහත බිත්තරය එයාගෙ අතින් අතෑරිලා මුහුදට වැටුණා. කර කියා ගන්න දෙයක් නැතුව ඉවාන් අසරණ වුණා. හදිසියේම මුහුදෙ වතුර කැලඹුණා. මාළුවා බිත්තරයත් අරන් වතුරෙන්



උඩට මතුවෙලා පාලමක් වගේ වතුර මතුපිට දිගා වුණා. ඉවාන් උගේ පිට මතින් ආපසු ගොඩ බිමට ගියා.

ඉවාන් අම්මා ළඟට ආවා. ඈ පුතා හැංගුවා. ඒ මොහොතෙම කොහේදෝ ඉඳලා කෝෂෙයි ඉගිල්ලිලා ආවා.

''ම්හ්, ම්හ්, රුසියන් ගඳයි.'' කෝෂෙයි කීවා.

ඉවාන් කුමාරයා බිත්තරය මිරිකන්න පටන් ගත්තා. එතකොට කෝෂෙයිට මොකක්දෝ අමුත්තක් දැනුණා.

''ආහ්, මගේ ඇඟ පණ නැති වේගෙන එනව.'' කෝෂෙයි කීවා.

එතකොට හැංගිලා සිටි තැනින් එළියට පැමිණි ඉවාන් කුමාරයා කෝෂෙයිට බිත්තරය පෙන්නුවා.

''මෙන්න කෝෂෙයි උඹේ පණ.''

කෝෂෙයි දණින් වැටුණා.

''ඉවාන් කුමාරයාණනි. මා මරන්න එපා. අපි යාළුවො වගේ ඉඳිමු. අපට පුළුවන් මුළු ලෝකයම යටත් කර ගන්න.''

ඔහුට සවන් නොදුන් කුමාරයා බිත්තරය මිරිකල පොඩි කෙරුවා. එතකොටම කෝෂෙයි මිය ගියා.



ඊට පස්සෙ ඉවාන් කුමාරයා අම්මත් එක්ක උපන් රටට යන්න පිටත් වුණා. ඒ යන අතර රාජකුමාරිකාවත් එකතු කරගත්තා.

සහෝදරයො නැවතිලා හිටිය තැන කඳු මුදුනට ආවට පස්සෙ කුමාරිකාව කියනවා.

''ඉවාන් කුමාරයාණනි, මට මංගල ඇඳුමයි දියමන්ති මුද්දයි සපත්තුයි ගේන්න අමතක වුණා. අපේ ගෙදර ගිහිල්ලා ඒවා අරන් එන්න.''

ඉවාන් කුමාරයා අම්මායි කුමාරිකාවයි ඉනිමඟ දිගේ කන්දෙන් පහළට බැස්සුවා. සහෝදරයො ඒ දෙන්න භාරගෙන ඉනිමඟ කඩලා දැම්මා. ඉවාන්ට පහළට බහින්න බැරි වෙන්න. ඒ ගැන ගෙදර ගිහින් කියන්න එපයි කියල අම්මායි කුමාරිකාවයි බය ගැන්නුවා. ඊට පස්සෙ කට්ටියම තමන්ගෙ රටට ආවා. රජ්ජුරුවො බිසව ගැනත් පුතුන් ගැනත් බොහොම සන්තෝෂ වුණා. ඉවාන් කුමාරයා ගැන විතරක් දුක් වුණා.

ඉවාන් කුමාරයා මනාලියගෙ ගෙදරට ඇවිත් මංගල මුද්දයි මංගල ඇඳුමයි සපත්තුයි අරන් ආපසු කඳු මුදුනට ආවා. ඇවිත් මුද්ද අනිත් අතට මාරු කළා. එතකොට මිනිස්සු දොළොස් දෙනෙක් ඔහු ඉදිරියේ පෙනී සිටියා.

''කුමක්ද ඔබේ අණ?''

'' මං මේ කන්දෙන් පහළට අරන් යන්න.''

මිනිස්සු වහාම ඉවාන් කන්දෙන් පහළට උස්සගෙන ගියා. කන්දෙන් පහළට ආව ඉවාන් මුද්ද ඇඟිල්ලෙ දා ගත්තා. මිනිස්සු අතුරුදන් වුණා. ඊට පස්සේ ඔහු තමන්ගෙ නගරයට ඇවිල්ලා එක මහලු කාන්තාවකට කතා කළා.

''මොනවද ආච්චියෙ නගරෙ අලුත් ආරංචි?''

''මේ අහපන්කො ළමයො, අමරණීය කෝෂෙයි අපේ බිසව පැහැරගෙන ගියා. බිසව හොයන්න පුත්තු තුන්දෙනා පිටත්වෙලා ගියා. දෙන්නෙක් බිසව බේරාගෙන ආපහු ආවා. තුන්වෙනියා ඒ කිව්වෙ ඉවාන් කුමාරයා ආ ගිය අතක් නෑ. රජ්ජුරුවෝ එයා ගැන බොහොම දුක්වුණා. අර කුමාරයො දෙන්නා කවුදෝ කුමාරිකාවකුත් එක්ක ඇවිල්ලා. වැඩිමලා දැන් ඒ කුමාරිකාව බඳින්න සූදානම් වෙනව.''

ඒත් කුමාරිකාව බඳින්න කලින් කොහේටදෝ ගිහින් මංගල මුද්ද ගේන්න කියනවලු. නැත්නම් ඒ වගේ එකක් හදල දෙන්න කියනවලු. කව්රුවත් ඒ වැඩේ කරන්න බාරගන්නෙ නෑ.''

''ආච්චි ගිහින් රජ්ජුරුවන්ට කියන්න ඒ වගේ මුද්දක් හදල දෙන්නම් කියල. ඉතුරු හරිය මං බලාගන්නම්.'' මහලු කාන්තාව මාලිගාවට ගියා.

''දේවයන් වහන්ස, මං මංගල මුද්ද හදල දෙන්නම්.''

''හොඳයි ආච්චියෙ හදාපන්. හැබැයි බැරි වුණොත් හිස ගසා දානව.''

මහලු කාන්තාව හොඳටම බය වෙලා ආපසු ගෙදර ඇවිත් ඉවාන් කුමාරයාට බල කළා මුද්ද හදන්න කියලා. කුමාරයා විහිළු කරන්න පටන් ගත්තා. ඇය බයෙන් වෙව්ල වෙව්ලා අඬමින් ඉවාන්ට දොස් පැවරුවා.

''උඹ මං මැරෙන්න ඇරලා මග අරිනව නේද?''

අඬලා අඬලා ඇයට අන්තිමේදී නින්ද ගියා. ඉවාන් කුමාරයා පාන්දරින්ම නැගිටලා මැහැලිය අවදි කළා.

''නැගිටපන් ආච්චියෙ. මේ මුද්ද ගිහින් දීපන්. කව්ද හැදුවෙ කියල ඇහුවොත් කියාපන් උඹයි හැදුවෙ කියල. මා ගැන එහෙම කියන්න එපා.''

මැහැලිය බොහොම සතුටින් මුද්දත් අරන් මාලිගාවට ගියා. කුමාරිකාව සතුටට පත්වුණා.

''මෙහෙම එකක් තමයි ඕනෑ.''

ඊට පස්සෙ කුමාරිකාව මනාලයාට කීවා මංගල ඇඳුමත් අරන් එන්න කියලා. නැත්නම් ඒ වගේ එකක් මහල දෙන්න කියා. ආච්චි මංගල ඇඳුමත් ගිහින් දුන්නා. ඊට පස්සෙ සපත්තු අරන් ගියා. ඒ ඔක්කෝම තමන්ම හැදූ බව ආච්චි කීවා.

මංගල උත්සවය දවසෙ රජ ඇඳුම් හැඳගත් ඉවාන් කුමාරයා පල්ලියට ගියා. ඒත් එයාගෙ සහෝදරයා ඒ වනවිටත් පැමිණ සිටියේ නෑ. ඒ හින්ද ඉවාන් කුමාරයා කුමාරිකාව විවාහ කර ගත්තා. දෙන්නා රජමාලිගාවට යනකොට මගදි මනාලයා හමුවුණා. එයා ලජ්ජාවෙන් ආපසු ගියා.

ඉවාන් කුමාරයා දැකලා රජ්ජුරුවො බොහොම සතුටු වුණා. වැඩිමල් පුත්තුන්ගෙ වංචාව ගැනත් දැන ගත්තා. මංගල උත්සවයෙන් පස්සෙ වැඩිමල් පුතුන් මාලිගාවෙන් එලවලා දමලා ඉවාන් කුමාරයා සිංහාසනයෙ උරුමක්කාරයා බවට පත් කළා.

කොල්ලා - ඇඟිල්ලා

එකෝමත් එක රටක ආච්චි කෙනෙකුයි සීය කෙනෙකුයි හිටියා. දවසක් ආච්චි උයන්න ගෝවා ගෙඩියක් කපන කොට කව්දෝ කතා කරනව ඇහුණා.

''අම්මේ. මං මේකෙන් එළියට ගන්න.''

ආච්චි පුදුම වුණා.

''කවුද ඔය කථා කරන්නෙ?''

''මං ඔබේ පුතා. මේ ගෝවා ගෙඩිය ඇතුළෙ ඉපදුණෙ.''

ආච්චි හොයලා බැලුවා. ගෝවා ගෙඩිය ඇතුළෙ කුරුමිට්ටෙක්. ඇඟිල්ලක් විතර උසයි. ආච්චි එයාට කොල්ලා ඇඟිල්ලා කියල නම තිබ්බා.

''කෝ මගේ තාත්තා?'' ළමයා ඇහුවා.

''හාන්න ගියා.''

''මං එයාට උදව් කරන්න යනව.''

කුරුමිට්ටා කුඹුරට ආවා.

''ඔබට දෙයියන්ගෙ පිහිටයි තාත්තෙ.''

සීයා වටපිට බැලුවා.

''මේක හරි පුදුමයක්නෙ. කතා කරනව ඇහෙනව. ඒත් කවුරුවත් පේන්න නෑ. කව්ද මාත් එක්ක කතා කරන්නෙ.?''

''මං ඔබේ පුතා.''

''පිස්සුද, උපන්තේකට මට දරුවො හිටියෙ නෑ.''

''මං මේ ඉපදුණා විතරයි. අම්මා ගෝවා ගෙඩියක් කැපුවා. මං කොල්ලා ඇඟිල්ල ඒකෙන් එළියට ආවා. ඉතිං මං උඹට උදව් කරන්න ආවා. මං හාන්නම්. තාත්තා බුලත් විටක් කාලා ටිකක් විවේක ගන්නකෝ.''

සතුටට පත් සීයා දවල් කෑම ගන්න සූදානම් වුණා. කොල්ලා ඇඟිල්ලා අශ්වයාගෙ කන ඇතුළෙ වාඩි වෙලා කුඹුර හාන්න පටන් ගත්තා. හැබැයි කලින්ම තාත්තට උපදේශයකුත් දුන්නා.

''කවුරු හරි කෙනෙක් ඇවිත් මාව සල්ලිවලට ඉල්ලුවොත් බය නැතුව විකුණාන්න. මං නැති වෙන්නෙ නෑ. ආපහු ගෙදර එනව.''

ඔන්න ඔය වෙලාවෙ එක මහත්තැන් කෙනෙක් එතනින් යන්න ආවා. එයාට පුදුමයි. අශ්වයා කුඹුර හානවා. හැබැයි මිනිහෙක් පේන්න නෑ.

''මෙහෙම දෙයක් නම් මගේ ජීවිතේට අහලවත්, දැකලාවත් නෑ. අස්සයෙක් තනියම කුඹුර හානව.''

''මගේ පුතානෙ කුඹුර හාන්නෙ'' සීයා කීවා.

''එයා මට විකුණාපන්.''

''නෑ. විකුණන්නෙ නෑ. මටයි ගෙදර උන්දැටයි තියන එකම සතුට එයා තමයි.''

''විකුණාල දාපන් සීයෙ.'' අමුත්තා බල කළා.

''හොඳයි. එහෙම නම් රුබල් දාහක් දෙන්න.''

''එච්චර ගණන් මොකද?''

''ඔබටම බලාගන්න පුළුවන් වෙයි. කොලුවා පුංචි තමයි. හැබැයි වැඩ ලොකුයි.''

අමුත්තා රුබල් දාහක් දීලා කුරුමිට්ටා අරන් සාක්කුවේ දාගෙන ගෙදර ගියා. කොල්ලා ඇඟිල්ලා සාක්කුවේ සිදුරක් හදාගෙන ඒකෙන් රිංගලා පැනලා ගියා.

ඒ යනකොට මඟදි රෑ වුණා. ඒ හින්දා තණකොළයක් අස්සට රිංගල නිදා ගන්න සූදානම් වුණා. එතකොටම හොරු තුන්දෙනෙක් එතැනින් යන්න ආවා.

''ආයුබෝවන් මහත්වරුනි, මේ කොහෙද යන්නෙ?''

''සුවාමිගෙ හරක් හොකරම් කරන්න යනව.''

''මාත් එන්නද?''

''උඹෙන් ඇති වැඩේ මොකක්ද?''

''මං යටින් රිංගල ගිහින් ගේට්ටුව ඇරල දෙන්නම්.''

''නියම වැඩේ. හරි එහෙනම් යමු.''

ඔක්කොම එකතු වෙලා පොහොසත් සුවාමිගෙ ගෙදරට ගියා. කොල්ලා ඇඟිල්ලා ගේට්ටුව යටින් රිංගල එහා පැත්තට ගිහින් ගේට්ටුව ඇරලා දුන්නා.

''අය්යල මේ මිදුලට වෙලා ඉන්න. මං හරක් මඩුවට ගිහින් හොඳම ගොනෙක් තෝරා ගෙන අරන් එන්නම්.'' කොල්ලා ඇඟිල්ලා කීවා.

හරක් මඩුවට ගිය කුරුමිට්ටා මහා හය්යෙන් බෙරිහන් දුන්නා.

''කොයි ගොනාද ගේන්න ඕනෑ ඈ ඈ? රතු එකාද කළු එකාද ආ...ආ?''

''කෑ ගහන්න එපා. මොකෙක් හරි අතට අහු වුණ එකෙක් අරන් වරෙන්.'' හොරු උත්තර දුන්නා.

කොල්ලා ඇඟිල්ලා හොඳම ගොනෙක් දක්කන් ආවා. හොරු ගොනා කැළේට අරන් ගිහින් මරලා හම ගහලා මස් බෙදා ගන්න පටන් ගත්තා.

එතකොටම කුරුමිට්ටා මහා හය්යෙන් කෑ ගහන්න පටන් ගත්තා.

''එඩේරෝ, එඩේරෝ, බැටළු එඩේරෝ, උඹ නිදිද මෙන්න මෙහේ වෘකයා බැටළුවෝ අරන් යනවෝ....''

ඒ සද්දෙට අවදි වුණ එඩේරා වෘකයා පස්සෙ බල්ලන් එලෙව්වා.

වෘකයා පැනලා දිව්වා. දුවලා දුවලා වෘකයාගෙ හොඳ පණ ගියා. දැන් ඌට හොඳටම බඩගිනියි.

''එළියට වරෙන්'' වෘකයා කීවා.

''මාව ගෙදර එක්කන් පලයං. එතකොට එළියට එන්නම්.''

වෘකයා මහල්ලාගෙ පැලට දුවගෙන ගියා. කොල්ලා ඇඟිල්ලා වෘකයාගෙ බඩෙන් එළියට පැනල අම්මා තාත්තා ළඟට ගියා. හැමෝටම හරිම සන්තෝසයි.

නිවුන්නු හත්දෙනා

සහ

තවත් කතා

රුසියන් භාෂාවෙන් පරිවර්තනය

එච්. ජයරත්න



Designed by Jagath Deraniyagala - 077 5918785

ලෝකයේ ජනකතා සාහිත්‍යය ඉතා දියුණු වූවකි. ළමයින් තුළ සදාචාරාත්මක ගතිපැවතුම් ඇති කිරීමටත් සාධාරණ සමාජයක් ගොඩනැගීමේ ආකල්පය වඩාලීමටත් ඉන් ලැබෙන අනුබලය ඉතා විශාලය.

රුසියානු ජනකතා මේ අතරිනුදු සුවිශේෂ තැනක් ගනී. රුසියානු ජන සමාජය සදාචාර සම්පන්න සාධාරණ සමාජයක් බවට පත් කිරීමේ කාර්යයේදී මෙම ජනකතා ඉටුකොට ඇති කාර්යභාරය සමාජ විද්‍යාඥයන්ගේත් මානව විද්‍යාඥයන්ගේත් පැසසුමට ලක්ව තිබේ. දහස් ගණනක් එවැනි ජනකතා අතුරින් මෙහි එන කතා තුනට්ද හිමි වන්නේ වැදගත් තැනකි. මෙම කතා රුසියානු ජාතික විතාලි ස්වාරත් සහ එලේනා අල්මාසවා විසින් චිත්‍ර සමඟ වඩාත් විචිත්‍ර ලෙස ළමයින් හමුවට ගෙන ඒම නිසා වර්තමාන ලෝකයේ දරුවන්ට ඉන් ලැබී ඇති ඵලය විශාලය.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙන් උපාධි ලැබ රුසියාවේ ලුමුම්බා විශ්වවිද්‍යාලයෙහි අවුරුදු 07 කට වැඩි කාලයක් අධ්‍යයන කටයුතුවල නියැලෙමින් රුසියානු සාහිත්‍යකරුවන් ඇසුරු කළ එච්. ජයරත්න විසින් සිංහල දරුවන්ට එම කතා දායාද කිරීමට ගෙන ඇති උත්සාහය ප්‍රශංසනීයය.

- සිරිසේන විතානගේ

සමීර පොතක්

සමීර ප්‍රකාශන
අංක 12, පොල්දූව, බත්තරමුල්ල.
දුර. : 0112 868249, 0716 058320
ඊ මේල් : menugraphics@gmail.com.

මිල රු. 380/-

ISBN - 978-955-0983-63-6

9 789550 983636